**දිඹුලාගල ප්‍රාදේශීය සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.3,449,162 ක වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වෙනුවෙන් ගෙවිය යුතු රු.77,227 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර්-දෙසැම්බර් මාසවලට අදාල රු.689,000 ක වැලි කැණීම් ආදායම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු වාහන හා යන්ත්‍ර කුලී ආදායම් රු.351,240 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම රු.93,950 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ප්‍රාදේශීය සභාවට අයත් රු.177,183,995 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 06 ක වටිනකාම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.49,575,442 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය හා රු.54,042,467 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | හානි හා පාඩු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.2,752,972 ක් වූ හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | -එම- | -එම- |
| (ඒ) | ප්‍රාදේශීය සභා කාර්යාලයේ සවිකර ඇති සෝලා පැනල් පද්ධතියේ රු.3,100,000 ක් වූ පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ පැවති රු.544,482 ක් වටිනාකම වූ වත්කම් 12 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 04 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂ සහ ඒවාට අදාළ ලේඛන/උපලේඛනවල දක්වා ඇති එකතුන් අතර රු.24,200,426 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපයෝගී ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.61,026,530 ක් වටිනා ගිණුම් ශේෂ 05 ක් යාවත්කාලීන කරන ලද උපයෝගී ලේඛන, උපලේඛන, ශේෂ සනාථ කිරීම් සහ ක්ෂය විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | අවශ්‍ය විස්තර සහ යාවත්කාලීන කරන ලද ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ | | | |
| 1994 ජූලි 18 දිනැති එන්සීපී/එල්ජී/9/7/19 දරන චක්‍රලේඛයේ 1 හා 2 ඡේදය | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව හෝ පළාත් පාලන සේවයට අයත් තක්සේරුකරුවෙකු ආයතනයේ සිටී නම් ඔහුගේ තක්සේරුව හෝ සලකා බලා වෙළඳපල කඩ කාමර සඳහා මාසික බදු මුදල තීරණය කළ යුතු අතර, එම තක්සේරු බදු කුලිය පස් වසරකට වරක්වත් සංශෝධනය කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ කඩ කාමර සඳහා මාසික බදු මුදල 2017, 2020 වර්ෂවලදී තාවකාලික තක්සේරුවක් මත තීරණය කර ඒ මත පදනම්ව අයකර තිබුණි. | විධිමත් පරිදි තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | තක්සේරු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයහාරය රු.11,965,451 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ අයහාරය රු.81,844,803 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 41,250,000 | 33,059,875 | 30,860,679 | 15,497,025 | 29,500,000 | 40,678,199 | 29,454,249 | 13,297,828 |
| (ii) | කුලී | 6,513,827 | 3,162,964 | 2,671,906 | 5,070,828 | 6,530,850 | 6,386,313 | 6,440,296 | 4,579,767 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 16,539,750 | 2,569,865 | 2,052,100 | 2,829,500 | 12,672,060 | 2,125,186 | 1,844,880 | 2,311,735 |
| (iv) | වෙනත් ආදායම් | 13,300,000 | 35,334,616 | 1,592,625 | 61,002,773 | 24,611,570 | 43,294,308 | 48,615,783 | 40,558,615 |
| | | 77,603,577 | 74,127,320 | 37,177,310 | 84,400,126 | 73,314,480 | 92,484,006 | 86,355,208 | 60,747,945 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.1,933,840 ක් හා හිඟ සතිපොළ බදු ආදායම රු.2,696,722 ක් විය. | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකළ යුතුය. |
| **(ආ) බලපත්‍ර ගාස්තු** | | |
| ඉකුත් වර්ෂයේ අවසානයට පැවති වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු හිඟය රු.2,311,735 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | -එම- |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| (i) ඉදිරිපත් කළ වාර්තා අනුව ජල ව්‍යාපෘති 04 ට අදාළ 2022 වර්ෂයේ බිල් කළ ආදායම රු.33,059,875 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තුව රු.15,497,025 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමින් සියයට 47 ක ප්‍රතිශතයක් හිඟ ආදායම් ලෙස පැවතුණි. | හිඟ ජල ගාස්තු ආදායම සැලකිය යුතු මට්ටමින් අඩුකිරීමට කටයුතු කරන බව. | ආදායම් ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.59,854,023 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.1,148,750 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ සතිපොළ බදු, ත්‍රී රෝද රථ ගාස්තු හා අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් යන කාරණා 03 වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සියල්ලම 2023 වර්ෂය තුළ පැනවීමට කටයුතු කරන බව. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. |
| **(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව එකතු කරන නොදිරන කසල බැහැර කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් නොවූ අතර, එලෙස එකතු වන ටොන් 434 ක පමණ ප්‍රමාණයක් දඹගහ උල්පත කසළ අංගනය තුළ වළ දැමීම සිදුකර තිබුණි. | දඹගහ උල්පත කසළ අංගනයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට කඩිනමින් සිදුකරනු ලබන අතර, 2023 වර්ෂයේ නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා කටයුතු කරන බව. | පරිසර හිතකාමී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| **(ඇ) ප්‍රතිපාදන නොසැලසීම** | | |
| දිඹුලාගල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ජල පිරිපහදු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැයක් සම්මත කරගෙන ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, වර්ෂයේදී රැස්කරන ලද රු.32,429,861 ක ආදායමින් ජල පිරිපහදු මධ්‍යස්ථාන නඩත්තු කටයුතු සඳහා රු.654,640 ක් එනම් ආදායමින් සියයට 2 කට අඩු ප්‍රතිශතයක් වැයකර තිබුණි. මේ හේතුවෙන් ජලයේ ගුණාත්මකභාවය, උපකරණ වල ආරක්ෂාව හා නියමිත ආදායම් අයවීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | 2022 අයවැය සම්මත නොවීම මත ප්‍රාග්ධන වියදම් දැරීම සීමාකර තිබූ හෙයින් සැලකිය යුතු වටිනාකමක් වියදමක් ලෙස දැරීමට නොහැකි වී ඇති බවත්, 2023 වර්ෂයේ ක්‍රියාත්මකව පවතින බව. | ජල ව්‍යාපෘති නඩත්තුව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ජල ව්‍යාපෘති 04 මගින් ජල සම්බන්ධතා 6557 ක් ලබාදී ඇති නමුත්, ඊට අදාළ ජල මීටර් 1167 ක් එනම් සියයට 17.8 ක් අක්‍රීය තත්ත්වයේ පවතින ජල මීටර්වලින් සමන්විත විය. | අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවත්න බව. | ප්‍රගතිය වාර්තා කළ යුතුය. |
| (ආ) | සභා අරමුදලින් රු.754,930 ක් වැයකර 2015 වර්ෂයේ සභිකයින් වෙත ලබාදී තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 ක් හා iPad යන්ත්‍ර 02 ක් ලබාගෙන වසර 06 කට අධික කාලයක් ගතව ඇතත් ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණු අතර, ලැප්ටොප් යන්ත්‍ර 05 ක් හා iPad යන්ත්‍රයක් ආපසු භාරදීමට නොහැකි මන්ත්‍රීවරුන් 06 දෙනෙකු විසින් ඊට අදාළ වටිනාකම 2019 ජූනි 26 දින සිට වාරික 30 කින් ගෙවීමට එකඟතාව පළකර තිබූ නමුත් එම ගෙවීමද පැහැර හැර තිබුණි. | අදාළ වටිනාකම සභාව වෙත පියවන ලෙස ලිඛිතව දැනුවත් කරන ලද බව. | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 දෙසැම්බර් 16 දින සභාවට ලබාදී තිබූ ගැල්වනයිස් කොඩිකණු 360 ක් හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු වෙත නිකුත් කර වසර 06 කට අධික කාලයක් ගතව ඇතත් ඒවා සභාව වෙත ලබාගෙන නොතිබුණි. | අදාළ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද බව. | අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 ජූනි සිට 2017 ජූනි 28 දක්වා කාලය තුල ජල ගාස්තු අයකිරීමේදී ලැබීම් කුවිතාන්සිවල මුල් පිටපතේ සඳහන් මුදලට වඩා අඩු මුදලක් අනුපිටපතෙහි සඳහන් කර රු.2,625,660 ක් බැහැර කරගැනීම පිළිබඳව විනය කාර්ය සංග්‍රහයේ 23.7 ප්‍රකාරව කටයුතු කිරීමේදී බැහැර කරන ලද මුදල රු.1,711,782 ක් ලෙස දක්වා විනය නියෝග පනවා තිබුණි. | වෙනස් වූ වටිනාකම සඳහා විමර්ශනයක් සිදුකර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලිඛිතව ඉල්ලීම් කරන ලද බව. | නිවැරදි වටිනාකම හඳුනාගෙන විනය නියෝග පැනවීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | 2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදුකරන ලද මූල්‍යමය අලාභය රු.1,367,681 ක් ලෙස හඳුනාගෙන 2021 දෙසැම්බර් 27 දින විනය | අවශ්‍ය කටයුතු කරන බව. | විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නියෝග පනවා තිබූ නමුත් ඒ පිළිබඳව වූ ක්‍රියාමාර්ග 2023 අප්‍රේල් වන විටත් ගෙන නොතිබුණි. | | |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව හා මිළදීගැනීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රමාණවත්ව සිටියදී අවස්ථා 09 කදී රු.1,127,472 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදනයෙන් බැහැරව මිළදීගෙන තිබුණි. | සභාවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගත යුතු බැවින් සඳහන් කරන ලද භාණ්ඩ කඩිනමින් මිලදීගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන සේදුම් ස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.2,034,430 ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ 2021 ඔක්තෝබර් 25 දින සමිතියක් සමඟ ගිවිසුම්ගතව ඒ සඳහා රු.406,886 ක අත්තිකාරමක් ගෙවීම් කර තිබුණි. මීට අදාළ ගිවිසුම් කාලය 2022 අප්‍රේල් 25 වන විට අවසන්ව ඇතත්, අදාළ කාර්යය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි. | අදාළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීමට කටයුතු කරන ලද බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ ප්‍රාදේශීය සභා සභිකයන්ගේ යෝජනා මත මහ සභාව විසින් අනුමත කරන ලද ග්‍රාමීය මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 07 ක් සඳහා රු.1,170,668 ක අත්තිකාරම් මුදල් ගෙවා වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් ව්‍යාපෘති වල වැඩ ආරම්භ කර නොතිබූ අතර, ඒ සඳහා ගෙවීම් කරන ලද අත්තිකාරම් මුදල් රු.1,170,668 ක් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් මුදල් අයකරගැනීම සඳහා නීතිමය කටයුතු සිදුකරන බව. | අයකිරීම් විස්තර වාර්තා කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 12 ක් විය. | සේවක පුරප්පාඩු පිළිබඳ අදාළ ආයතන දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168(2) වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා දිඹුලාගල ප්‍රාදේශීය සභාව විසින් අයවැයක් සම්මත කරගෙන නොතිබුණි. | අධිකරණයෙන් පැනවූ වාරණ නියෝගයත් සමඟ අයවැය සම්මත කරගැනීමට හැකි වූයේ නැති බව. | ප්‍රාදේශීය සභා පනත අනුව සභාවක් පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |